● කොළඹ නගරයේ ජීවත්වන

# පැල්පත්වාසීන් ඉවත් කරන බවට අනියත බියක් පතුරුවාගෙන යනවා

▶ මිලින්ද මොරගොඩ



උතුරු කොළඹ ස්වෛට්පුර ජන හමුව අමතන අයුරු.

❑ ලක්ෂ්මී ජයකොඩි

**කොළඹ** වෙසෙන පැල්පත් වාසීන් කොළඹ නගරයෙන් ඉවත් කරන බවට අනියත බියක් ඇතිකර ගෙන ඇති අතර ලෝකයේ කොහේවත් මහජනතාව නැති සංවර්ධනයක් දැකිය නොහැකි බවත් ආර්ථිකයට මහජනතාව අවශ්‍ය වන අතර කොළඹ ජනතාව නගරයෙන් පිට පදිංචිකර රටට අවශ්‍ය සේවය කළ නොහැකි බවත් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් කොළඹ නගරාධිපති ධුර අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා පවසයි.

සැලසුම් සහගතව කොළඹ නගරයේ ගොඩනැගීම සඳහා දින සියයක වැඩපිළිවෙලක් ඉදිරිපත් කරන බවද ඒ මහතා කියයි.

තවද රජය හා නගර සභාව එකතුවී කොළඹ නගරය ගොඩ නගන සැලසුමක් සකස් කළ යුතු බවද පැහැදිලි සැලසුමකින් පමණක් වැඩකිරීමෙන් ඉතිහාසයේ තිබුණ අභිමානවත් තත්ත්වයට නැවතත් කොළඹ නගරය පත් කළ හැකි බවද හෙතෙම සඳහන් කරයි.

උතුරු කොළඹ ස්වෛට්පුර ක්‍රීඩාංගණයේදී පසුගියදා පැවති සංවාදශීලී ජන හමුවකට සහභාගීවෙමින් මිලින්ද මොරගොඩ මහතා මේ අදහස් ප්‍රකාශ කර තිබේ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මිලින්ද මොරගොඩ මහතා

කොළඹ නගරයේ එකිනෙකට වෙනස් ප්‍රශ්න තිබෙනවා. පසුගිය ගැටුම් සහිත පරිසරය තුළ නගරය සංවර්ධනයට ලක්වුණේ නැහැ. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව සමාජයේ ඇවෙන ප්‍රශ්න ගැන සිතන්නට අවස්ථාව ලැබී තිබෙනවා. නැගෙනහිර හා බටහිර කොළඹ ආසනවලට වඩා උතුරු කොළඹට තිබෙන ප්‍රශ්න විවිධයි. දේශපාලනයෙහි නිරත වූ පසුගිය අවුරුදු දහය තුළම මම එම ප්‍රශ්න දැක්කා. පාර්ලිමේන්තුවේදී ප්‍රතිපත්ති සකස් කළ හැකියි. නගර සභාව කරන්නේ මහජනතාවට සේවාවක් පොදු පහසුකම් ලබාදීමක්. පාර්ලිමේන්තුවට පත්වන විට උතුරු කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා දිස්ත්‍රික්කයේම ජනතාවගේ නියෝජිතයා ලෙස ක්‍රියා කළ යුතුයි. මේ මැතිවරණ ක්‍රමය නිසා මහජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීම පහසු නැහැ.

මෙම ප්‍රදේශයේ තිබෙන ඇවෙන ප්‍රශ්න රාශියක් අද ඉටු කළ යුතුව තිබෙනවා. එයින් නිවාස ප්‍රශ්නය බරපතළයි. ඒ සඳහා රජය සමග එකතුවී නිවාස 35,000 ක් ඉදිකරන්නට සැලසුම යොදා තිබෙනවා. මේවා මහල් නිවාස වන අතර අවුරුදු තුනක් ඇතුළත මෙම නිවාස ඉදි කිරීමට අපි කටයුතු කරනවා.

දුගී දුප්පත් සමාජය දුප්පතුන් හැටියට වතුවලට කොටු කරලා ඔවුන්ගේ ඡන්දයෙන් කොළඹ නගර සභාව දිනන්නට මට අවශ්‍ය නැහැ.

ඔබ සමග මේ අවස්ථාවට පැමිණ සිටින දරුවන් බලන්න. මේ දරුවන්ගේ අනාගතය ගොඩනැගීම අවශ්‍යයි. වත්තක දරුවෙකු පාසලකට ගියාම පාසලට ගන්නෙ නැහැ. පාසල අයිනේ තිබෙන වත්තට පාසලේ දොරටුව වැහිලා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගැන අපි බලන්න අවශ්‍යයි.